# මේ දයාවංශ ජයකොඩිගේ හැටිමද?

දයාවංශ ජයකොඩි මහතාගේ සමහර ලිපි උපහාස රසයෙන් අනූනය. ඒ බව නොකියාම බැරිය. 2004 ජනවාරි 4 ඉරිදා ලක්බිම ඉරිද සංග්‍රහයේ කර්තෘට ලියුම් හි තිබූ ඒ මහතාගේ ලිපියත් එවැනි උපහාස රසැති එකකි. මීට කලින් හඳගමගේ තනිතටුව කෘතිය අරබයා, දයාවංශ ජයකොඩි මහතා තමා දන්නා හිඟන පවුලක් උදාහරණ කොට ගනිමින් මෙවැනි ප්‍රහසනාත්මක සිනමා විචාරයක නිරත වූවා අපට මතකය.

ඒ මහතා සරෝජා, පුංචි සුරංගනාවී හා පුරහඳ කළුවර වැනි චිත්‍රපට මිථ්‍යාදෘෂ්ටික අබෞද්ධ බලවේගවල ආධාර ලබා නිපදවූ චිත්‍රපට බව සඳහන් කරයි. මමද උපතින් බෞද්ධ, බෞද්ධ දර්ශනය විශ්වාස කරන පුද්ගලයකු වෙමි. චිත්‍රපට නිපදවීමේදී ඒවා බෞද්ධ චිත්‍රපට හා නිපදවීමට බෞද්ධ බලවේගවලම ආධාර ලබා ගත යුතු යැයි අප නම් අසා නැත. මේ රටේ බෞද්ධ නොවන පිරිසක් සිටින බව අප අමතක කළයුතු නැත.

ඊටත් උක්ත චිත්‍රපට යුද්ධය, ජාතිවාදය ආදිය ගැන කතා කළා මිස බෞද්ධ දර්ශනය ගැන කතා කළ බවක් අපට මතක නැත. "සූරිය අරණ" චිත්‍රපට අධ්‍යක්ෂවරයා අදාළ චිත්‍රපටයට භික්ෂු චරිත තෝරා ගත්තේ ඇයිදැයි ජයකොඩි මහතා ප්‍රශ්න කරයි. භික්ෂූන් වහන්සේලාත් අප සමාජයේ සාමාජිකයින් පිරිසකි. උන්වහන්සේලා පිළිබඳව චිත්‍රපටයකින් කතා කිරීමේ වරදක් තිබේද? භික්ෂු චරිත චිත්‍රපටවලට යොදා නොගත යුතු යැයි කොහේ හෝ තහනමක් තිබේද? නැත. ජයකොඩි මහතා ශ්‍රේෂ්ඨ හිමි නමකගේ අඳනකඩයක් ගැලවී ගිය කතාවක් ගැන කියයි. එසේ නම් කුඩා ළදරු වයසේ පසුවන සාමණේර නමකගේ චීවරය ගැලවී යාමට නොහැකිද? ඊටත් චිත්‍රපටවල තිබිය යුත්තේ ආදර්ශමත් (ආදර්ශමත් යන වචනය ජයකොඩි මහතාට හැඟෙන පරිදි) දේ පමණමද? ශ්‍රේෂ්ඨ පුද්ගලයකු පිළිබඳ චිත්‍රපටයක් නිපදවූවහොත් එම පුද්ගලයා ශ්‍රේෂ්ඨ නිසා ඔහුගේ වැරදි ක්‍රියාකාරකම් චිත්‍රපටයෙන් කතා කිරීම වැරදිද?

නිර්මාණකරුවකුට මේ මේ තේමා ඔස්සේ මේ මේ දේම නිපදවිය යුතු යැයි සීමා පැනවීම මහම විහිළුවකි. ඊටත් නිර්මාණයක් යනු නිර්මාපකයාගේ ප්‍රකාශන මාධ්‍යයක් මිස හොඳම ප්‍රදර්ශනය කරන ප්‍රදර්ශන පුවරුවක් නොවේ. ඊටත් මෙවැනි ප්‍රකාශවලින් බෞද්ධ දර්ශනයට අයහපතක් මිස යහපතක් සිදු නොවේ. බෞද්ධ දර්ශනය යනු නම්‍යශීලී ආගමික සහජීවනය අගයන එකකි. මෙසේ දකින දකින දෙයෙහි බෞද්ධ අබෞද්ධ බව විමසීමට යාමෙන් හා සෑම දෙයක්ම බෞද්ධ විය යුතු යැයි පැවසීමෙන් සිදුවන්නේ බෞද්ධ (බෞද්ධ දර්ශනයට පටහැනි) මූලධර්ම වාදයක් බිහිවීම පමණි.

චිත්‍රපටයක පූර්ව ප්‍රචාරක පටයක් දැක මෙලෙස උඩ පැනීම ජයකොඩි මහතාගේ සිවිල් ප්‍රතිරූපයට තරම් නොවේ.

චිත්‍රපට නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වයට එරෙහිව මෙලෙස චණ්ඩි පාට් දැමීම චිත්‍රපට රසිකයින් ලෙස අපි පිළිකුලෙන් හෙළා දකිමු. සත්‍ය බුදු දහමට නිගා වන ලෙසින් බුදු දහම මූලධර්මවාදී කිරීමට දරන උත්සාහයද නින්දා සහගත බව පවසමු. මෙය ලියන මම උක්ත චිත්‍රපට නිර්මාණකරුවන්ට සුදු හුණු ගෑමක් සිදු නොකරන අතර ඔවුන්ව පුද්ගලිකව නොහඳුනන බවද මින් මට කිසිදු වාසියක් අත් නොවන බවද කිව යුතුමය.■

□ ඉසුරු චාමර
සෝමවීර